# 2018 නව වසර ඔබට කෙසේද ?

ශ්‍රී ශකරාජ වර්ෂ 1940 හෙවත් ක්‍රි.ව. 2018 වර්ෂය, 2017 දෙසැම්බර් මස 31 වෙනි දින මද්‍යම රාත්‍රිය ගෙවී යෑමත් සමඟ, සූර්යයා සිංහ රාශියේ අංශක 20 කලා 21 සහ චන්ද්‍රයා වෘෂභ රාශියේ අක 23 කලා 44 ක් සම්පූර්ණ කරමින් මුවසිරස නැකතේ ප්‍රථම පාදයට පැමිණි අවස්තාවේ උදාවේ. දුරුතු පුන් පොහොය ආරම්භ වීමට ආසන්නයේ උදාවන මෙම මොහොත, ග්‍රහ ලොවේ පියා වශයෙන් සැලකෙන රවි ස්වකේෂ්‍රගත සහ ග්‍රහලොවේ මව වශයෙන් සැලකෙන සඳු උච්චක්ෂේත්‍රගත බලයෙන් යුක්ත ශුභදායී අවස්තාවකි.

නව අවුරුදු උදාවත් සමග අප හැමගෙ ජීවිතවලට අදාලව මෙන්ම ඉඩකඩම්, දේපල, නිවාස, විවාහය, ආර්ථිකය, රැකියාව සහ සෞඛ්‍යය ආදී අවශ්‍යතා ගණනාවකට අදාල කාර්ය සිද්ධීන් සඵල කරගැනීම සඳහා වූ අපේක්ෂාසහගත බවක් මෙන්ම අවිනිශ්චිත බවත් හදවත් තුළ ඇතිවනු නොඅනුමානය. මෙම ධනාත්මක මන්ම, නිශේධාත්මක තත්වයන් කෙරෙහි අපගේ ජන්ම පත්‍රයන්ට අදාල ග්‍රහ රටාවන් පෙළ ගැසෙන ආකාරය හා එම කාල වකවානු පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට හැකි නම්, එය අපගේ ජීවිත සාර්ථක කර ගැනිමට මහත් රුකුලක් වනු ඇත. එක් එක් අයගේ ජන්ම පත්‍ර වෙන වෙනම අධ්‍යයනය කිරීම අපහසු වුවත්, ඒ ඒ ලග්නයන් ආශ්‍රිත ග්‍රහ රටාවන් හැසිරෙන ආකාරය ඇසුරින් ඉහත සඳහන් ක්ෂේත්‍රයන් තුළ දෘශ්‍යමාන කවන ශුභ අශුභ තත්ත්වයන් දළ වශයෙන් අපිට නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව 2018 වර්ෂයේ ලග්නාශ්‍රිත පලාපල මෙසේ දක්වමු

මේෂ ලග්නය:බ්‍රහස්පති 7 වැන්නේ ද, ශනි 9 වැන්නේද ගෝචර වන අවස්ථාවක ඔබට නව වර්ෂය උදා වෙයි. ගෘහස්ත කටයුතු ආශ්‍රිතව, නව පිබිදීමකින් යුතුව කටයුතු කිරීමට ඔබ ක්‍රියාත්මක වනු ඇත. රාහු සිවුවැන්නේ බැවින් කාර්ය බහුලත්වය තුළ අවිවේකී බවක් ඇති කරයි. කෙසේ වුවද, ආත්ම විශ්වාසයකින් යුතුව සියළු කටයුතු මනා ලෙස සැලසුම් කරගැනීමට ඔබට හැකිවෙයි. මාර්තු-අප්‍රියෙල් අතර වියදම් අධික කාලයක් වනු ඇත.

වර්ෂය ආරම්භයේදී මුල්‍යමය වශයෙන් ප්‍රමාණික දියුණුවක් ඇති වුවද අප්‍රේල්-සැප්තැම්බර් අතර කාලය ව්‍යාපාර ආශ්‍රිත සුළු හෝ පසුබෑමක් දක්නට ලැබෙයි. එබැවින් එම කාලය තුළ නව ආයෝජන සහ මුල්‍යමය ගණුදෙනු සම්බන්ධයෙන් වඩාත් සැලකිල්මත් වන්න. රැකියාවන්හි නියුතු ජන්මීන් හට උසස්වීම් හෝ වෘත්තිමය වරප්‍රසාද අත්වීමේ ඉඩකඩක් පවතින අතර, නව රැකියා අපේක්ෂකයින් සඳහා යහපත් ප්‍රතිචාර අපේක්ෂා කළ හැක. විශේෂයෙන් විදේශයන්හි රැකියා අපේක්ෂා කරන්නන්හට ඒ සඳහා අවස්ථා උදාවෙයි. අවිවාහක මේෂ ලග්න හිමියන්ට මංගල යෝජනා ගලා එන අතර, ප්‍රේම සබඳතා එල දරණ අවස්තාවක් වේ. හෘදයාබාධ සහ මුත්‍රා රෝගාදියෙන් පසුවන්නන් වඩාත් සැළකිලිමත් වන්න. පාද හා දණහිස් ආශ්‍රිත මන්ම ශීර්ෂාබාද හටගැනීමේ ඉඩකඩ පවතී. ශුභ දින: අඟහරුවාදා, ශුභ අංක: 6,8,9.

වෘෂභ ලග්නය: වර්ෂාරම්භයේදී ගුරු 6 වැන්නේ ද සිකුරු 8 වැන්නේ ද වේ. යෝගකාරක ශනි සිකුරු සමග වීම ඔබට යහපත්ය. කෙසේ වුවද ශනි 8 වැන්නේ ඒරාෂ්ටක තත්වයක් දක්නට ලැබුණද, යෝගකාරක ග්‍රහයා බැවින් අශුභ තත්වයක් නොමැත. ඔබගේ අතමිට සරුවන කාලයකි. නව ආදායම් මාර්ග කෙරෙහි ඔබ ක්‍රියාත්මක කවෙයි. කෙසේ වුවද, අප්‍රියෙල් මාසයේ සිට රැකියා ආශ්‍රිත සුළු සුළු ගැටළු ඇතිවීමෙන් ඔබගේ මානසික සතුට තරමක් අඩුවනු ඇත. එබැවින් එම පරිසරය යහපත් කරගැනිමට උනන්දු වන්න. වර්ෂයේ අවාසානය තුළ ඔබ පවුලට සම්බන්ධ ඥාතීන්ගෙන් බාධාකාරී බලපැම් වරින්වර ඇතිවිය හැකි බැවින් දැනුවත් වන්න. ඔබ විදේශ පදිංචිය සඳහා යෑමට අපේක්ෂා කරන්නෙකු නම් ඒ සඳහා යහපත් ආවස්තාවක් වේ. සෞඛ්‍ය තත්ත්වය තරමක් පිරිහෙනු දක්නට ඇත. විශේෂයෙන් පාද ආබාධ, හා ස්නායු ගත ආබාධ ඇති අය සැළකිලිමත් වන්න. යෝගකාරක ශනි බලවත් අයට අශුභ තත්වයන් අවම වෙයි. ශුභ දින: සිකුරාදා, ශුභ අංක: 6, 5, 8.

මිථුන ලග්නය: ශුභ අශුභ මිශ්‍රව පවතින වර්ෂයකි. මුල් මාස 7-8 පමණ කාල ශුභ ඵල අත්වෙයි. ගුරු සිකුරු පරිවර්තන වීමෙන් උදාවන ''මාලවි'' යෝගය ඔබගේ ආර්ථික හා රැකියා කටයුතු මෙන්ම ගෙදර දොර ආශ්‍රිත කටයුතු සාර්ථකත්වය කරා රැගෙන යයි. විශේෂයෙන් විභාග අපේක්ෂකයින්ට උසස් ප්‍රතිඵල ලඟා කර දීමට විද්‍යාස්ථානගත ගුරු දායක වනු ඇත. එමෙන්ම ලග්නාධිපති වශයෙන් බුද 6 වැන්නේ ගෝචරවීමෙන් ඔබගේ අධ්‍යාපනික කුසලතා වර්ධනය කරයි. ගමන් බිමන් තරමක් අධික වුවද, ඒවා ඵලදායිතාවය කෙරෙහි ධනාත්මක ලෙස බලපානු ඇත. 2018 ඔක්තෝබර් මාසයේ පමණ සිට, මෙම ශුභදායී තත්වයන් ක්‍රමයෙන් අඩුවී යන බවක් පෙන්නුම් කරයි.

රාහු 2 සහ කේතු 8 පිහිටීම ශාරීරික සෞඛයය කෙරෙහි මෙන්ම, ගෘහස්ත ජීවිත කෙරෙහි අයහපත් සන්නිවේදනයකි. මෙම කාලය තුළ උදරාබාධ සහ බෙල්ලේ අසනීප හටගැනීමට බොහෝ දුරට ඉඩ තිබේ. අඹු සැමි සන්නිවේදනය තරමක් රළු වීමෙන් පවුලේ සමගිය පළුදු විය හැක. විවාහ අපේක්ෂක-අප්ක්ෂිකාවන් හට ස්වකීම මංගල කටයුතු සඳහා අයහපත් කාලයකි. (වර්ෂයේ අගභාගය) එමෙන්ම ඔබගේ කාර්ය සාධනය කෙරෙහි සතුරු කරදර ඇතිවිය හැකි බැවින් කල්පනාකාරී වන්න. සමීප ඥාතීන් අනපේක්ෂිත අයුරින් ඔබ සමඟ අමනාප වේ. ගුරු ලග්නයට දෘෂ්ටිගත බැවින් 2018 ඔක්තෝබර් මැද දක්වා පැවති මානසික සමබරතාවය, අවසාන කාර්තුව තුළ ක්‍රමයෙන් දුර්වල වේ. මෙම තත්ත්වය පිළිබඳ අවධානයෙන් පසු වන්න. ශුභ දින: බදාදා, ශුභ අංක: 3, 5, 12.

කටක ලග්නය: රාහු ලග්නගතව හැසිරෙන මෙම කාල පර්ච්ඡේදය ඔබට තරමක් අයහපත් වුවද, ගුරු සිවුවැන්නේ කේන්ද්‍රගත වීම යහපත් පිණිස වේ. රාහු 11 වැන්නට යහපත් ලෙස නිවේදනය වන ජන්මීන් හට හදිසි මුල්‍යමය ලාභයන් අත්වීමේ ඉඩකඩක් පවතී. එමෙන්ම මෙතෙක් ඔබ හට විකිණීමට අපහසුව පැවති පාරම්පරික ඉඩකඩම් අලෙවි කිරීමට අවස්තා උදාවෙයි.

රාහු යහපත් ලෙස නියෝජනය වන කටක ලග්න විද්‍යාර්ථීන් හට අනපේක්ෂිත ලෙස විභාග ජයග්‍රහන අපේක්ෂා කල හැක. සාමාන්‍යයෙන් ඔබගේ කාර්යයන් තුළ අවිවේකය දැනෙයි. වියදම් අධික වෙයි. ඇතැම් විට ඔබ නොසිතු අවස්තාවන්හි ගෙදර දොර කටයුතු කෙරෙහි බාධක ඇතිවේ. මෙතෙක් පැවති යටපත් වූ අම්හිරි දේවල් මානසික ගැටළු බවට පරිවර්තනය වෙයි. රැකියා පරිසරය තුළින් ඔබ අපේක්ෂා නොකළ අභියෝගයන්ට මුහුන දීමට සිදුවිය හැකිය. ඇතැම් විට දින නියම කරගත් මංගල කටයුතු හිටි හැටියේ වෙනස් වීමට ඉඩ තිබේ. සෞඛ්‍යමය කරුණු අතින් වුවද මෙම වර්ෂය ඔබට යහපත් නොවේ. විශේෂයෙන් වකුගඩු ආශ්‍රිත ආබාධ, උගුරේ ආබාධ සහ චර්ම රෝග ආදියට වැඩි ප්‍රවණතාවක් පවතී. විවාහ ගිවිස ගැනීම ආදි කාර්යයන්හිදී දෙවරක් සිතා බලන්න. මානසික සමතුලිතභාවය කෙරෙහි අවධානය යොමු කරන්න. ශුභ දිනය: සඳුදා-බදාදා, ශුභ අංක: 2, 7, 9,

සිංහ ලග්නය: ඔබ තුළ මානසික වශයෙන් පසුගිය වර්ෂයේ පැවති ශක්ති සමුදාය තරමක් දුර්වල වන බැවින්, පමාවීම්, අමතක වීම් සහ අතපසුවීම් දක්නට ඇත. විශේෂයන් අධ්‍යාපනික සාධනය කෙරෙහි වඩාත් උනන්දු විය යුතුය. කුජ බලවත් ජන්මීන් හට කාර්මික සහ යාන්ත්‍රික ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් තුළින් සාර්ථකත්වයක් ඇතිකරයි. මාර්තු-ජූලි අතර කාලාය තුළ කෙටි සහ දුරබැහැර සංචාර බහුල වේ. ඇතැම් විට විදේශ සංචාරයන් පවා යෙදිය හැක. කෙසේ වුවද, අපේක්ෂා සහගත ඉලක්කයන් සපුරා ගැනීම නොහැකි වීමෙන් අසහනකාරී මානසිකත්වයන් උද්ගත වේ. ගදර දොර පරිසරය සහ අනෙකුත් සමාජීය බලපෑම් තුළින් ඔබ මන්දගාමිත්වයකට පත්විය හැකිය.

සිංහලග්න ව්‍යාපාරිකයින් හට තරඟකාරීත්වය අභියෝගකාරී විය හැක. විශේෂයෙන් හවුල් ව්‍යාපාර ආදී කාර්යයන්හිදී සූක්ෂම අවධානය අවශ්‍ය වේ. විවාහ කටයුතු පිලිබඳව වූ තීන්දු තිරණ ගැනීමේදී වඩාත් බුද්ධිමත් වන්න. නිවාස, දේපළ මිල දී ගැනීම ආදි ආයෝජනයන් 2018 සැප්තැම්බර් වලින් පසු ශුභයි. මෙම වර්ෂය ශාරීරික සෞඛ්‍යය සම්බන්ධයෙන් වඩාත් සැලකිළිමත් වන්න, විශේෂයෙන් සෙම්, කෝප වීමෙන් හටගන්නා රෝග සහ මුත්‍රා ආබාධයන් ටත්, හදිසි, වැටීම්, තැලීම් සහ තුවාල ආදියටත් මුහුණ පෑමට සිදුවිය හැක. ශුභ දින: බදාදා, ශුභ අංක: 1, 4, 5.

කන්‍යා ලග්නය: කන්‍යා ලග්නයෙන් උපන් ඔබගේ ජන්ම පත්‍රයේ ගුරු දෙවැන්නේ ද ශනි 4 වැන්නේ ද ගමන් කරයි. වර්ෂ ආරම්භයේ බුද, සිකුරු දෙදෙනාම සිවුවැන්නේ නියෝජනය වෙමින්, ඔබගේ කාර්ය සාධනය කෙරෙහි උපරිම දායකතවයක් ලබා දෙයි. සමස්ථ වර්ෂගත ග්‍රහ බලය ශුභදායක බැවින්, අධ්‍යාපනික වශයෙන් ජයග්‍රහණය අත්පත් වේ. ආදායම් මාර්ග සරුවන අතර, නව මුල්‍යමය ආයෝජන කෙරෙහි ඔබ උනන්දු කරවයි. එම කාර්යය කළමනාකරණය සඳහා වූ මානසික ව්‍යුහයන් මනා ලෙස ක්‍රියාත්මක වේ.

කලාව, සංගීතය ආදී සෞන්දර්යාත්මක ක්ෂේත්‍රයන්හි නියුක්ත කන්‍යා ලග්න හිමියන්ගේ ස්වකීය ක්ෂේත්‍රගත අධ්‍යාපනික/පුහුණුවීම් කටයුතු ඵලදායී ප්‍රවේශයකට යොමු වෙයි. එපමණක් නොව, ඔබ කුමන වෘත්තීය අංශයක යෙදුනද, එහි කාර්යයන් තුළින් ඔබ තෘප්තියක් ලබනු ඇත. ගුරු බලවත් ලෙස නිවේදනය වූ ජන්මීන් හට විදේශ රැකියා හෝ වෘත්තීමය පුහුණුවීම් කටයුතුවල නිරතවීමේ දොරටු විවෘත වේ. අවිවාහකයින්ගේ මංගල කටයුතු ඉටුකර ගැනිම සඳහා ශුභදායී වසරකි. වර්ෂයේ දෙවන භාගය තුළ ව්‍යාපාර සහා වෘත්තීමය අංශයන්ගේ කැපී පෙනෙන දියුණුවක අපේක්ෂා කළ හැකිය. කෙසේ වුවද ඔබ පදිංචි පරිසරය ඇසුරින් පීඩාකාරී තත්වයන් උදාවිය හැකි බැවින් කල්පනාකාරී වන්න, සුළු සුළු අසනීප තත්වයන් හැරුණු විට සෞඛ්‍යමය වශයෙන් යහපත් තත්වයක් පවතී. ශුභදායී කාල පරිච්ඡේදයක් බව කිව යුතුය. ශුභ දින: බදාදා, ශුභ අංක: 5, 7, 8.

තුලා ලග්නයහ: ගුරු ලග්නයේ දිග්බල ලෙස ගෝචර වෙමින්, බලවත් වුවද ලග්නාධිපතිගේ සතුරු ග්‍රහයෙකු බැවින්, බලවත් අන්‍ය ලග්නයන්ට රතම් ශුභඵල අපේක්ෂා කළ නොහැකිය. උත්සාහයේ තරමට ප්‍රතිඵල නොලැබීම හේතුවෙන් ඔබ තුළ අම්හිරි සිතුවිලි ඇති කරයි. රැකියාව, ආර්ථික කටයුතු, සමාජ සේවය ආදි ක්ෂේත්‍රයන්ට අදාළ කාර්යයන්හිදී නිවැරදි හා සැළසුම් සහගත වන්න. ඒවා තුළ නිවැරදි මාවතකට පිවිසීම අවශ්‍ය වේ. විශේෂයෙන් රාහු 10 වැන්නේ ගෝචර වන බැවින් (කටක රාශිය) ඔබගේ කටයුතු ආශ්‍රිත යම් යම් ව්‍යාකූලතා ඇති කරන බැවින් වඩ වඩාත් බුද්ධිමත් වන්න. අඹු-දරු සබඳතා මෙන්ම සේවා හෝ ව්‍යාපාර ස්ථාන ආශ්‍රිත කටයුතු මනා ලෙස පවත්වා ගැනීමට විශේෂයෙන් උනන්දු විය යුතුය.

ඇතැම්විට, පදිංචි ස්ථානය හෝ රැකියා ස්ථානය මාරුවීමට සිදුවීමෙන් ඔබ තුළ යම් මානසික පීඩනයක් ඇතිවේ. මුල්‍යම ගණුදෙනු සහ ණය ගැනීම් ආදී කාර්යයන්හිදී සැළකිලිමත් වන්න, 2018 අගභාගය මුල් භාගයට වඩා ඔබට යහපත් වේ. එහෙත් පැවති කරදරකාරී වාතාවරණයට යම් ආලෝකයක් ලැබෙයි. මුල් භාගය වඩාත් සැළසුම්සහගත විය යුතුයි. සෞඛ්‍ය තත්වයෙහි සැලකිය යුතු පිරිහීමක් ඇති නොවේ. ජය දින: සිකුරාදා, ජය අංක: 1,2,4.

වෘශ්චික ලග්නය: ගුරු, ශනි දෙදෙනාම යහපත් ලෙස ගෝචර නොවන බැවින්, වර්ෂයේ අවසාන කාර්තුව පමණ වන තෙක් ඔබගේ කටයුතු තරමක් මන්දගාමී වේ. රාහු 9 වැන්නේ ගෝචර වෙමින් ලග්නයට දෘෂ්ටිගත වේ. මෙම බලපෑම තුළ ඔබගේ සුලසුම් හිටි හැටියේ වෙනස් විය හැක. අනපේක්ෂිත වියදම් ඇතිවේ. එපමණක් නොව, රැකියා ස්ථාන මාරුවීම්, ඥාතීන් සම්බන්ධ කටයුතු, ගෘහජීවිතාශ්‍රිත පරිසරය, විවාහ කටයුතු සහ මිතුරු ඇසුර ආදී සාධකයන් කෙරෙහි අයහපත් සහ අනපේක්ෂිත බලපෑම් ඇතිවේ. කෙසේ වුව ද, මෙම වර්ෂය ඔබගේ අධ්‍යාපනික හා ශාස්ත්‍රීය කටයුතුවල යම් ප්‍රගමනයක් අපේක්ෂා කළ හැක. විශේෂයෙන් කලා හා සංගීත ආදී කාර්යයන්හි යෙදෙන්නන් හට ශුභදායී වේ. විනෝද සංචාරයන්හි යෙදීමට ද මෙම කාලය ඔබට යහපත්ය.

ඉහත සඳහන් කළ පරිදි, රැකියා, විවාහ සහ සමාජ සම්බන්ධතා කටයුතුවලදී තරමක් කල්පාකාරී වන්න. ව්‍යාපාරික සහ ගෘහ ජීවිත පරිසරය යහපත් කරගැනීම කරෙහි වැඩි අවධානයක් යොමු කරිමද අවශ්‍ය වේ. හෘදයාබාධ, ලේ දෝෂ, සහ වාතාබාධ ආදියෙන් පෙළෙන වෘශ්චික ලග්න ජන්මින්ගේ සෞඛ්‍යය ආශ්‍රිත පිරිහීමක් දක්නට ලැබෙයි. කෙසේ වුවද, මැයි-නොවැම්බර් අතර විදේශ ගතවීමේ අපේක්ෂා සඵලත්වයට පත්වෙයි. විවාහ කටයුතු කෙරෙහි ශුභාදායී පරිසරයක් නිර්මාණය වේ. සියළු කටයුතු විධිමත් ලෙස සුළසුම් කර ගැනීම තුළ ඔබට යහපත උදාකරන වර්ෂයකි. ශුභ දින: අඟහරුවාදා, ශුභ අංක: 1, 4, 9.

ධනු ලග්නය:
ශනි ලග්නයේ ඒරාෂ්ටක තත්වයක් උදාකළ ද, ගුරු අයස්ථානගත (11වැන්නේ) බැවින් ධනු ලග්න ජන්ම ලාභීන්ට මෙම වර්ෂය අයහපත් නැත. ඇතැම් අවස්ථාවන්හිදි ආර්ථික සහ මුල්‍යමය අංශයන් තුළ ප්‍රගමනයක් ඇති වුවද මානසික ප්‍රබෝධය